# 1.7 පාසල් ශිෂ්‍යයන් විසින් සිංහල භාෂාව සම්බන්ධයෙන් ඇති කරගනු ලබන ගැටලු හා එයින් සිදුවන භාෂා පරිහාණිය
## (ගම්පහ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් ඇසුරින්)

අනුරින් ඉන්දිකා දිවාකර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
පී. ඒ. දිල්මිණී කුමාරි පෙරේරා
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂාව වුව ද වර්තමානයේ දී භාෂාව භාවිතයේ දී සෑම ක්ෂේත්‍රයක ම පැන නැගී ඇත්තේ ගැටලු සහගත තත්ත්වයකි. ඊට මුල්වන හේතුන් වන්නේ භාෂාව පිළිබඳ ව මෙන් ම භාෂාව නිසි පරිදි පරිහරණය කිරිමේ අවබෝධයක් බොහෝ දෙනකුට නොමැති වීම යි.

ඒ කෙරෙහි බලපාන එක් කාරණයක් වශයෙන් පාසල් සමයේ දී ශිෂ්‍යයන්ට මුහුණ දීමට සිදු වන ගැටලු හඳුන්වා දිය හැකිය. මෙය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ. එනම් ශිෂ්‍යයන් විසින් ඇති කරගනු ලබන ගැටලු හා ශිෂ්‍යයන්ට මුහුණ දීමට සිදුවන ගැටලු වශයෙන් ය. මෙහි දී අපගේ අවධානය යොමු වූයේ ශිෂ්‍යයන් විසින් ඇති කරගනු ලබන ගැටලු පිළිබඳ ව ය. ශිෂ්‍යයන් විසින් ඇති කරගනු ලබන ගැටලු ප්‍රධාන අංශ දෙකකින් දෙකකින් යුක්ත වේ. ශිෂ්‍යයන් හිතාමතා ම ඇති කරගනු ලබන ගැටලු හා ශිෂ්‍යයන්ගේ නොදැනුවත්කම නිසා ඇති කරගනු ලබන ගැටලු යන්න යි. මේ නිසා ඇතිවන තත්ත්වය නම් භාෂාව නිසි ලෙස අධ්‍යයනය කිරීමට හා පරිහරණය කිරීමට සිසුන් නොපෙලඹීම යි.

මෙහි ප්‍රතිඵලය වශයෙන් හඳුනාගත හැකි වන්නේ වර්තමානයේ දී මෙන් ම අනාගතයේ දී ලංකාවේ සමාජ, සංස්කෘතික, ආර්ථික මෙන් ම දේශපාලන යන සෑම ක්ෂේත්‍රයක දී ම නිසි ලෙස භාෂාව පරිහරණය නොවීම හා එහි පරිහාණි තත්ත්වය ක්‍රමයෙන් උදාවීම යි.